# ගිණුම්කරණ සමීරණ - ප්‍රශ්න පත්‍ර ඇගයීම්

01. සාරංග දිසානායක විසින් 2018.01.01 දින රු. 100 000 ක් යොදා " සහන කාර්යාල සේවා "නමින් ප්‍රවාහන සේවා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර , 2018.03.31 දිනෙන් අවසන් මාස තුන සඳහා ව්‍යාපාරයට අදාල තොරතුරු පහත දැක්වේ.

01 / 01 - මාස 3ක කාලයක් සඳහා බිල් පත්‍ර මුද්‍රණයට ගෙවීම රු. 5 000

01 / 02 - සාරංග පුද්ගලිකව භාවිතා කළ 2018.01.02 දිනට රු. 1 200 000 ක් වටිනා වාහනය ව්‍යාපාරයට යෙදවීම. ( එහි ඵලදායි ජීව කාලය වර්ෂ 10 ක් ලෙස සහ සුන් බුන් අගයක් නොමැත් ලෙස ඇස්තමේන්තු කරන ලදී . )

02 / 07 - සාරංගගේ පෞද්ගලික සංචාරයක් සඳහා රු. 10 000 ඉන්ධන බිලක් ව්‍යාපාරය විසින් දරා ඇත.

02 / 10 - වෙනත් ආදායම් ලැබීම් රු. 50 000

03 / 07 - වාහන අළුත්වැඩියා වියදම රු. 20 000 ( එයින් රු. 5 000 ක් මෙතෙක් ගෙවා නොමැත. )

03 / 31 මුල් කාර්තුව සඳහා ප්‍රවාහන සේවා ආදායම ලෙස රු. 600 000 ලැබුණි.
මුල් කාර්තුව සඳහා ව්‍යාපාරය සැපයූ ප්‍රවාහන සේවා සඳහා ඉන්ධන වියදම රු. 200 000 ක් වූ අතර ඉන් රු. 150 000 ගෙවන ලදී.

03 / 31 මසකට රු. 25 000 බැගින් රියදුරු සේවක වැටුප් ගෙවීම රු. 75 000

අවශ්‍ය වන්නේ ,

(1) ඉහත ගනුදෙනු වල බලපෑම + සහ - ලකුණු සහිතවපහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිතා කරමින් ඉදිරිපත් කිරීම.

| දිනය | වත්කම් | හිමිකම් | වගකීම් |
|---|---|---|---|
| | | | |

(2) 2018.03.31 දිනෙන් අවසන් මාස තුන සඳහා ආදායම් ප්‍රකාශනය .

## 02.

දෙව්මිණිගේ ව්‍යාපාරයේ 2020.04.01 දිනට ශේෂ සහ 2020.04.30 දිනෙන් අවසන් මාසය සඳහා ගනුදෙනු පහත දැක්වේ.

| ශේෂ | රු. 000 |
|---|---|
| ජංගම නොවන වත්කම් | 6 000 |
| ජංගම වත්කම් | 2 000 |
| ජංගම වගකීම් | 1 000 |
| හිමිකම | 7 000 |

ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇති අතර VAT අනුපාතය 10% කි. භාණ්ඩ ගැනුම් සහ විකුණුම් සඳහා VAT ඇතුලත් කළ යුතුවේ.

ගනුදෙනු ,

(01) විකුණුම් රු. 500 000 කි. මෙයින් 40% ක් ණයට විකුණුම් වේ. ( පිරිවැය මත 25 % ක දළ ලාභයක් තබාගෙන ව්‍යාපාරය භාණ්ඩ විකුණයි. )

(02) ඉහත ණයට විකුණුම් වලින් 1 /4 ක් ආපසු එව්වා .
(03) 2020 මාර්තු මාසයේ විදුලි බිල්පත රු. 35 000 කි. එය 2020 අප්‍රේල් මාසයේ දී ගෙවීය. අප්‍රේල් මාසයේ විදුලි බිල්පත රු. 30 000 ක් වන අතර එය ලැබී තිබුණේ 2020 මැයි මාසයේ දී ය.
(04) වෙළඳ ගෙවිය යුතු දෑ රු. 200 000 ක් අයිතිකරු සිය පෞද්ගලික මුදලින් පියවීමේ දී ලද වට්ටම රු. 5% කි.
(05) කොමිස් ආදායම රු. 50 000 ක් ලැබුණි.
(06) වෙළඳ ලැබිය යුතු දෑ සඳහා රු. 80 000 ක චෙක්පතක් ලද අතර දුන් වට්ටම රු. 2 000 කි.
(07) රු. 300 000 ක ලකුණු කළ මිල සහිත භාණ්ඩ අත්පිට මුදලට ගැනීමේ දී ලද වෙළඳ වට්ටම 10% කි.
(08) අයිතිකරු රු. 10 000 ක් සිය පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගත්තා.
(09) භාණ්ඩ ගෙන ඒම කුලී රු. 18 000 ක් ගෙව්වා .
(10) ජංගම නොවන වත්කම් සඳහා වාර්ෂික ක්ෂය රු. 600 000 කි.

අවශ්‍ය වන්නේ ,

( 01 ) ඉහත ව්‍යාපාරයේ අංක 01 සිට 10 දක්වා ගනුදෙනු ධන ( + ) , සෘණ ( - ) ලකුණු සහිතව වටිනාකම් සමඟ පහත ආකාරයේ වගුවක් මඟින් ගිණුම්කරණ සමීකරණයට ආදේශ කිරීම.

| ගනුදෙනු අංකය | ජංගම නොවන වත්කම් | ජගම වත්කම් | ජංගම වගකීම් | රඳවාගත් ඉපයුම් | ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|
| | | | | | |

(02) 2020 අප්‍රේල් මාසය සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් ජර්නල

(03) 2020 අප්‍රේල් මාසය සඳහා මුදල් ගිණුම ( 2020.04.01 දින මුදල් ශේෂය රු. 250 000 කි. )

(04) ශුද්ධ වත්කම් පදනම මත 2020 අප්‍රේල් මාසය සඳහා ලාභය හෝ අලාභය ගනනය කිරීම .

## 03.

නාමල් ඔටෝ කෙයා තනි පුද්ගල ව්‍යාපාරයකි. මෙම ව්‍යාපාරය පුද්ගලික සහ ආයතනික ගනුදෙනු කරුවන්ට වාහන නඩත්තු සේවා සපයනු ලබයි. 2020.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ආරම්භක ශේෂ පහත පරිදි විය.

| වත්කම් | රු. 000 | වගකීම් හා හිමිකම් | රු. 000 |
|---|---|---|---|
| දේපළ පිරියත හා උපකරණ | 900 | දිගුකාලීන ණය | 400 |
| තොගය ( නඩත්තු අමුද්‍රව්‍ය ) | 160 | වෙළඳ ගෙවිය යුතු දෑ | 90 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 130 | ගෙවිය යුතු විදුලිය | 12 |
| ඉදිරියට ගෙවූ කුලිය | 240 | ආයතන ගනුදෙනු කරුවන්ගෙන් ලද අත්තිකාරම් | 10 |
| සේවකයන්ට ගෙවූ වැටුප් අත්තිකාරම් | 34 | හිමිකම් | 1 052 |
| බැංකුවේ ඇති මුදල් | 100 | | |

මෙම ව්‍යාපාරයේ සියළු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මඟින් සිදු කරනු ලැබේ.

2020 ජනවාරි මාසය තුළදී පහත ගනුදෙනු ව්‍යාපාරය තුල සිදු කරන ලදී.

i. වාහන සෝදුම් යන්ත්‍රයක් රු. 360 000 කට ණයට මිලදී ගන්නා ලදී. 2020.01.01 දිනෙන් ආරම්භ වී වර්ෂ තුනක කාලයක් තුල මෙම ණය මුදල ගෙවිය යුතු වේ.

ii. පිරිවැය රු. 130 000 ක් වූ නඩත්තු ද්‍රව්‍ය මිලදී ගන්නා ලද අතර , ඒ සඳහා රු. 60 000 ක මුදලක් ගෙවන ලදී. ඉතිරි මුදල මාස දෙකක් තුල ගෙවිය යුතු වේ.



JMS Learning "your virtual learning partner" suranga sampath

iii. පුද්ගලික ගනුදෙනු කරුවන්ට රු. 140 000 ක නඩත්තු .සේවා මුදලට සපයන ලදී. මේ සඳහා භාවිතා කරන ලද නඩත්තු ද්‍රව්‍ය වල පිරිවැය රු. 86 000 ක් විය.

iv. රු. 12 000 ක් වූ අයිතිකරුගේ ජීවිත රක්ෂණ වාරිකය ව්‍යාපාරය විසින් ගෙවන ලදී.

v. රු. 5 000 ක වට්ටමක් ලබා දීමෙන් පසු රු. 45 000 ක චෙක්පතක් ණයගැතියෙකුගෙන් ලැබුණි.

vi. ආයතන ගනුදෙනු කරුවකුට රු. 50 000 ක නඩත්තු සේවා සපයන ලදී. 2020.01.01 දිනට ආයතනික ගනුදෙනු කරුවකුගෙන් ලද අත්තිකාරම් මෙම ගනුදෙනුවට අදාල වන අතර , ඉතිරි මුදල වූ රු. 40 000 ක් සේවාව ලබාදීමෙන් පසුව ලැබුණි. පිරිවැය රු. 30 000 ක් වූ නඩත්තු ද්‍රව්‍ය මෙම සේවාව සඳහා භාවිතා කරන ලදී.

vii. වැඩිහිටි නිවාසයක වාහනයක් සඳහා නඩත්තු සේවාවක් නොමිලේ සපයන ලදී. පිරිවැය රු. 6 000 ක් වූ නඩත්තු අමුද්‍රව්‍ය මේ සඳහා භාවිතා කරන ලදී.

viii. ව්‍යාපාරයේ මාසික ගිණිරක්ෂණ වාරිකය වූ රු. 4 000 ක් අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවන ලදී .

ix. දිගුකාලීන ණය රු. 400 000 සඳහා රු. 67 000 ක ණය වාරිකයක් ගෙවන ලදී. එය තුල රු. 17 000 ක පොලියක් ඇතුලත් විය.

x. ආයතනික ගනුදෙනුකරුවන්ට රු. 300 000 ක නඩත්තු සේවා ණයට සපයන ලදී. මෙම වටිනාකම මත 2% ක වෙළඳ වට්ටමක් ලබා දෙන ලදී. මෙම සේවා සැපයීම සඳහා රු. 154 000 ක් පිරිවැය වූ නඩත්තු ද්‍රව්‍ය භාවිතා කරන ලදී.

xi. සේවකයන්ගේ මාසික වැටුප රු. 84 000 ක් වූ අතර , 2020.01.01 දිනට පැවැති වැටුප් අත්තිකාරම් අඩුකිරීමෙන් පසු ඉතිරි මුදල ගෙවන ලදී.

xii. 2020.01.01 දිනට ගෙවිය යුතු විදුලි බිල්පත ගෙවන ලදී. රු. 11 000 ක විදුලි බිල්පතක් ජනවාරි මාසය සඳහා ලද අතර එය මෙතෙක් ගෙවා නොමැත.

xiii. පිරිවැය රු. 8 000 ක නඩත්තු ද්‍රව්‍ය හානිවූ අතර ඒවා රු. 3 000 ක අත්පිට මුදලට විකුණන ලදී.

xiv. පසුගිය මාසය තුලදී කපා හරින ලද වෙළඳ ණයගැති ශේෂයක් සඳහා රු. 14 000 ක් ලැබුණි.

xv. ව්‍යාපාර ස්ථානයේ මාසික කුලිය රු. 20 000 ක් වේ. 2020.01.01 දිනට කලින් ගෙවූ කුලිය තුළ දක්වා ඇත්තේ 2020 ලිත් වර්ෂය සඳහා ගෙවන ලද කුලී මුදලයි.

**අවශ්‍ය වන්නේ ,**

( 1) 2020.01.01 දිනට ශේෂ සටහන් කර අංක ( i ) සිට ( x v ) දක්වා ඇති ගනුදෙනු වල බලපෑම ( අගයන් සහිතව ) ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කරන්න. එක් එක් වටිනාකම් ඉදිරියෙන් එය වැඩි වේ නම් ( + ) ද , අඩුවේ නම් ( - ) ද , යන්න සඳහන් කරන්න. ( මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී පහත දී ඇති අකෘතියට සමාන ආකෘතියක් භාවිතා කරන්න )

| | වත්කම් | | | | | වගකීම් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පිරියත සහ උපකරණ | තොගය | වෙළඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගුකාලීන ණය | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | හිමිකම |
| ආරම්භක ශේෂය | | | | | | | | | | |
| ගනුදෙනු | | | | | | | | | | |
| ( I ) | | | | | | | | | | |
| ( ii ) | | | | | | | | | | |
| …….. | | | | | | | | | | |

| ……… | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අවසාන ශේෂය | | | | | | | | | | |

(2 ) 2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය.

## 04.

කමල් විසින් 2018.04.01 දින ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරයේ 2019.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන වලින් උපුටාගන්නා ලද ශේෂයන් පහත දී ඇත

| | රු. " 000 " |
|---|---|
| දේපළ පිරියත හා උපකරණ - පිරිවැයට ................................ | 4 500 |
| තොගය ( ගිණුම්කරණ වාර්තා මත පදනම්ව ) ............................ | 600 |
| | |
| වෙළඳ ලැබිය යුතු දෑ ..................................................... | 820 |
| කළින් ගෙවූ කුලී ......................................................... | 480 |
| මුදල් ශේෂය ............................................................. | 610 |
| වෙළඳ ගෙවිය යුතු දෑ ..................................................... | 100 |
| උපචිත වියදම් ........................................................... | 90 |
| ලද අත්තිකාරම් ........................................................ | 240 |
| 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය ...................... | 580 |
| 2018.04.01 දින හඳුන්වා දුන් ප්‍රාග්ධනය ....................................... | 6 000 |

ව්‍යාපාරයේ සියළු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුම මඟින් සිදු කරනු ලැබේ.

2019.03.31දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත අයිතම සැලකිල්ලට ගෙන නොමැති බව පසුව හෙළිදරව් විය.

( I ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ , පිරියත සහ උපකරණ මත ක්ෂය රු. 500 000 කි.

( ii ) 2019 මාර්තු මාසය සඳහා ප්‍රදර්ශනාගාරයේ කුලිය රු. 80 000 ක් කලින් ගෙවූ කුලී ගිණුමෙහි ඇතුලත් කර ඇත.

( iii ) 2019 මාර්තු මාසය සඳහා රු. 5 000 ක විදුලි බිල 2019.03.31 දිනට ගෙවා හෝ ගිණුම්ගත කර නොතිබුණි.

( iv ) 2019.03.30 දින පිරිවැය රු. 80 000 ක ණයට මිළදී ගත් භාණ්ඩ , ගිණුම්පොත් වල සටහන් කර නොතිබුණි.

( v ) 2019.03.30 දින පිරිවැය පිරිවැය රු. 200 000 ක භාණ්ඩ රු. 400 000 ක අත්පිට මුදලට විකිණීම ගිණුම්පොත්වල සටහන් කර නොතිබුණි. කෙසේ වුව ද මේ සඳහා ලද චෙක්පත 2019.04.01 දින බැංකුවේ තැන්පත් කර තිබුණි.

( vi ) පිරිවැය රු. 400 000 ක තොග අයිතම වර්ෂය තුල දී විනාශ වූ අතර එම අයිතම විකිණිය හැකි තත්ත්වයක නොතිබුණි. කෙසේ වුව ද මෙම අයිතම පිරිවැයට 2019.03.31 දිනට තොගයේ ඇතුලත්ව තිබුණු අතර ඒවාට උපලබ්ධි අගයක් නොවීය.

( vii ) අයිතම 40 ක් මිලට ගැනීම සඳහා ගනුදෙනු කරුවකු විසින් ඇනවුමක් ඉදිරිපත් කරන ලදී. එම භාණ්ඩ වල විකුණුම් මිල රු. 240 000 ක් වූ අතර මෙම මුදල වර්ෂය තුලදී ලැබී ඇත. මෙම මුදල , ලද අත්තිකාරම් ගිණුමේ සටහන් කර ඇත. කෙසේ වුව ද මෙම අයිතම වලින් අඩක් පමණක් 2019.03.31 දින වන විට ගනුදෙනු කරුට බෙදා හැර ඇති අතර ඒවායේ පිරිවැය රු. 80 000 කි. තව ද මෙම බෙදා හැරීමට අදාල කිසිදු සටහනක් තබා නොමැත. ඉතිරි භාණ්ඩ බෙදාහැරිය යුත්තේ ඉදිරි වර්ෂය තුලදී ය.

( viii ) 2019.03.28 දින ණයගැතියෙකුගෙන් ලද රු. 20 000 ක චෙක්පතක් බැංකුව විසින් 2019.03.31 දි අගරු කර ඇති බව2019.04.03 ලද බැංකු ප්‍රකාශනයෙන් හෙළිදරව් විය.

( ix ) තව ද 2019.03.31 දින ණයගැතියෙකු විසින් රු. 50 000 ක චෙක්පතක් බැංකුවේ සෘජුවම තැන්පත් කර ඇති බව බැංකු ප්‍රකාශනය තුලින් අනාවරණය විය. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මෙම මුදල අයකර ගත නොහැකි වටිනාකමක් ලෙස කපා හැර තිබුණි.

( x ) ව්‍යාපාරය විසින් ගෙවූ අයිතිකරුවකුගේ දරුවකුගේ විභාග ගාස්තු රු. 2 000 ක් බැංකු ප්‍රකාශනයේ හෙළිදරව් විය.

අවශ්‍ය වන්නේ ,

(1) අංක ( I ) සිට ( x ) දක්වා අයිතම වල බලපෑම ( අගයන් සහිතව ) ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කර , එක් එක් අගය ඉදිරියෙන් වැඩි වේ නම් ( + ) ද , අඩු වේ නම් ( - ) ද , යන්න සඳහන් කරන්න. ( පිළිතුරු සැපයීමේ දී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිතාකරන්න. )

| අයිතම අංක | වත්කම් | | | | | වගකීම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පිරියත සහ උපකරණ | තොගය | වෙළඳ ලැබිය යුතු දෑ | කලින් ගෙවූ කුලී | මුදල් | වෙළඳ ගෙවිය යුතු දෑ | උපචිත වියදම් | ලද අත්තිකාරම් | හිමිකම |
| ශේෂය | 4 500 | 600 | 820 | 480 | 610 | 100 | 90 | 240 | 6 580 |
| ගනුදෙනු | | | | | | | | | |
| ( I ) | | | | | | | | | |
| ( ii ) | | | | | | | | | |
| ........ | | | | | | | | | |
| ......... | | | | | | | | | |
| සංශෝධිත ශේෂය | | | | | | | | | |

(2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ලාභයනිවරදි කිරීම දක්වන ප්‍රකාශනයක්

(3) ඉහත අයිතම අංක ( i ) , ( iii ) , ( iv ) , ( ix ) , සහ ( x ) නිවරදි කිරීම / සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් ( සංලක්ෂය සහිතව )

## 05.

2017 ජනවාරි මාසය තුළ ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනුවල බලපෑම පහත ගිණුම්කරණ සමීකරණය තුලින් නිරූපනය වේ. මෙම මාසය තුල අයිතිකරු කිසිදු මුදලක් ව්‍යාපාරයෙන් ලබාගෙන නොමැත.

“ 000 “

| ශේෂ සහ ගනුදෙනු | වත්කම් | | | | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපල පිරියත සහ උපකරණ | තොග | වෙළඳ ලැබිය යුතු දෑ | බැංකුවේ මුදල් | බැංකු ණය | වෙළඳ ගෙවිය යුතු දෑ | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපයුම් |
| 2017.01.01 දිනට ශේෂය | 2,000 | 1,300 | 500 | 200 | 1,000 | 800 | 1,000 | 1,200 |
| 1 | + 1,000 | | | | +1,000 | | | |
| 2 | | +250 | | | | +250 | | |
| 3 | | | | +600 | | | +600 | |
| 4 | | | | -400 | | | | -400 |
| 5 | | -1,000 | +1,800 | | | | | +800 |
| 6 | | | -500 | | | -500 | | |
| 7 | -50 | | | | | | | -50 |
| 8 | | | -150 | | | | | -150 |
| 9 | | | | -180 | -150 | | | -30 |
| 10 | | +200 | -250 | | | | | -50 |
| 2017.01.31 දිනට ශේෂය | 2,950 | 750 | 1,400 | 220 | 1,850 | 550 | 1,600 | 1,320 |

අවශ්‍ය වන්නේ :

1 ඉහත 1 සිට 10 දක්වා ඇති එක් එක් ගනුදෙනු වටිනාකම් සහිත ව විස්තර කිරීම

2 2017.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලාභය හෝ අලාභය

3 වත්කම් සහ වගකීම් , ජංගම හා ජංගම නොවන ලෙස වර්ග කරමින් 2017.01.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකානය

## 06.

සමන් සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ රු. 60,000 ක ලාභයක් වාර්තා කරන ලදී . 2016.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ රු. 50,000 ක මුදල් ශේෂයක් පෙන්වන ලදී .කෙසේ වුවද ගිණුම්පොත් නිසියාකාරව පවත්වා නොගනී . පහත ගනුදෙනු ගිණුම් පොත්වල වාර්තා කර නොමැති බව පසුව හෙළිදරව් විය .

| අංකය | ගනුදෙනුව |
|---|---|
| 01 | රු. 80,000 කට භාණ්ඩ ණයට විකිණීම . මෙම භාණ්ඩවල පිරිවැය රු. 60,000 ක් විය . |

02 රු. 36,000 කට ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම .මෙම භාණ්ඩ වල පිරිවැය රු. 30,000 ක් විය .
03 පිරිවැය රු. 10,000 ක් වූ භාණ්ඩ පරිත්‍යාග කිරීම .
04 ව්‍යාපාරයේ නඩත්තු වියදම් රු. 10,000 විය. මෙයින් රු.6,000 ක් සමන් විසින් පෞද්ගලිකව ගෙවන ලද අතර ඉතිරිය ව්‍යාපාරය විසින් ගෙවන ලදී .
05 2015.07.01 දින 12% වාර්ෂික පොළියට රු. 300,000 ක බැංකු ණයක් ලබා ගැනීම . පොළිය මෙතෙක් ගෙවා නොමැත
06 2016.03.31 දින රු.280,000 ක අත්පිට මුදලට ත්‍රී රෝද රථයක් මිලදී ගැනීම .
07 ණයගැතියකුගෙන් අයවිය යුතු රු.30,000 ක් ඔහුට ණය හිමියකු ලෙස ගෙවිය යුතු වූ රු. 50,000 කට එරෙහිව හිලව් කිරීම .ඉතිරිය මුදලින් ගෙවන ලදී .
08 රු.12,000 ක් සමන්ගේ ජීවිත රක්ෂණ වාරිකය වෙනුවෙන් ගෙවා ඇත.
09 ගනුදෙනු අංක 1 ට අදාලව ලැබිය යුත් මුදල 5% වට්ටමක් අඩු කිරීමෙන් පසුව ලැබීම .
10 පෙර වර්ෂයකදී බොල්ණය ලෙස කපා හළ රු.15,000 ක් ලැබීම.

අවශ්‍ය වන්නේ :

(1 ) මෙම ගනුදෙනු වල බලපෑම ( අගයන් සහිතව ) ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කර , එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් ( + ) ද , අඩු වේ නම් ( - ) ද යන්න සඳහන් කරන්න . ( පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිතා කරන්න )

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පිරියත හා උපකරණ | තොග | වෙළඳ ලැබිය යුතු දෑ | මුදල් | දිගුකාලීන ණය | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | |
| | | | | | | | | |

( 2 ) 2016.03.31 දිනට සංශෝධිත මුදල් පොත

( 3 ) 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය . ( හිමිකම මත ගනුදෙනු වල ශුද්ධ බලපෑම පදනම්ව )

## 07.

නාරද 2015.03.01 දින රු. 150,000 ක් මුදල් ආයෝජනය කරමින් ඔහුගේ නිවසේ කොටසක ලිපිද්‍රව්‍ය අලෙවි සැලක් ආරම්භ කරන ලදී . තවද ඔහු ව්‍යාපාරයේ භාවිතය සඳහා රු.60,000 ක් වටිනා ලී බඩු එදිනම ගෙන එන ලදී . ඔහු ව්‍යාපාරය නමින් බැංකු ගිණුමක් ආරම්භ කල අතර සියලු මුදල් ගනුදෙනු එම ගිණුම තුලින් සිදුකරන ලදී . පහත ගනුදෙනු පළමු මෙහෙයුම් මාසය තුල දී සිදු විය .

ගනුදෙනු අංකය ගනුදෙනුව

1. රු.100,000 ක ලිපිද්‍රව්‍ය අයිතම අත්පිට මුදලට මිලදී ගන්නා ලදී .

2. රු. 70,000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය අයිතම රු.100,000 ක අත්පිට මුදලට විකුණන ලදී .



JMC learning "your virtual learning partner" suranga sampath

3. රු. 150,000 ක ලිපිද්‍රව්‍ය අයිතම ණයට මිලදී ගන්නා ලදී .

4. රු. 30,000 ක ලිපි ද්‍රව්‍ය දෝස සහිත නිසා සැපයුම් කරුවන්ට ආපසු යවන ලදී .

5. 2015.03.31 දින රු. 120,000 කට පරිගණක යන්ත්‍රයක් ණයට මිලදී ගන්නා ලදී .මෙම මුදල මාස 18 ක කාළයක තුල ගෙවිය යුතුය .

6. රු. 100,000 ක් පිරිවැය වූ ලිපි ද්‍රව්‍ය අයිතම රු.140,000 කට ණයට විකුණන ලදී .

7. රු. 15,000 ක් වූ කාර්යාල සහකරුගේ මාසික වැටුප ගෙවන ලදී .

8. නාරදගේ පෞද්ගලික භාවිතයට රු . 30,000 ක් ව්‍යාපාරයෙන් ලබාගන්නා ලදී .

9. ගෙවිය යුතු ශේෂය මත 5% ක වට්ටමකට යටත්ව ලිපිද්‍රව්‍ය සැපයුම්කරුට ගෙවිය යුතු මුදල ගෙවන ලදී .

10. 5% ක වට්ටමක් අඩු කිරීමෙන් පසුව ණය ගැතියන්ගෙන් ලැබිය යුතු මුදල ලබා ගන්නා ලදී .

අතිරේක තොරතුරු :

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| | දේපළ , පිරියත සහ උපකරණ | තොගය | වෙළඳ ලැබිය යුතු දෑ | බැංකු | වෙළඳ ගෙවිය යුතු දෑ | ණය | |
| | | | | | | | |

2015 මාර්තු මාසය සඳහා රු. 3,000 ක් වූ ව්‍යාපාරයේ දුරකථන ගාස්තු බිල 2015.04.02 දින ලැබුනි.

ව්‍යාපාරයේ දේපළ , පිරියත සහ උපකරණ වාර්ෂිකව 20% බැගින් සරළ මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු වේ

අවශ්‍ය වන්නේ :

(1) ඉහත 1 සිට 10 දක්වා ගනුදෙනු වල බලපෑම ( අගයන් සහිතව ) ගිණුම් කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කර , එක් එක් අගය ඉදිරියෙන් එය වැඩිවේනම් ( + ) ද, අඩු වේ නම් ( - ) ද යන්න සඳහන් කිරීම . ( මේ සඳහා පහත ආකෘතිය භාවිතා කරන්න )

( 2 ) 2015.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශය .

( 03 ) පහත ආකෘතිය භාවිතා කරමින් 2015.03.31 දිනට ව්‍යාපාරයේ හිමිකමේ සංයුතිය .

රු. 000

| | |
|---|---|
| ආරම්භක ප්‍රාග්ධනය | |
| කාළච්ඡේදය සඳහා ලාභය | |
| අඩුකළා : ගැනිලි | |
| 2015.03.31 දිනට හිමිකම | |

JMC uranga sampath Learning "your virtual learning partner"

## 08.

2018.01.01 දින සමන් විසින් ලිපිද්‍රව්‍ය අලෙවි කරන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයෙහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මඟින් සිදු කරනු ලබයි. ව්‍යාපාරයේ කළමණාකරු ලෙස සමන් සේවය කරන අතර විකුණුම් සහ තොග පවත්වාගෙන යාම සඳහා සහාය වීමට සේවකයකු බඳවා ගන්නා ලදී.

2018 ජනවාරි මාසයේ දී පහත ගනුදෙනු ව්‍යාපාරය තුල සිදු විය.

| අංකය | දිනය | චෙක්පත් අංකය | ගනුදෙනුව |
|---|---|---|---|
| | 01/ 01 | | සමන් මුදලින් රු. 600 000 ක් ආයෝජනය කරන ලද අතර රු. 180 000 ක් වටිනා ලී බඩු රැගෙන එන ලදී. |
| | 01 /03 | 5001 | රු. 300 000 ක ලිපිද්‍රව්‍ය අත්පිට මුදලට මිලදී ගන්නා ලදී. |
| | 01 /07 | 4450 | රු. 100 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු.150 000 කට අත්පිට මුදලට විකුණන ලදී . |
| | 01 / 10 | | රු. 150 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 200 000 කට ගාමිණිට ණයට විකුණන ලදී . |
| | 01 / 12 | | රු. 400 000 ක ලිපිද්‍රව්‍ය සීමිත ජයමාල් පොදු සමාගමෙන් ණයට මිලදී ගන්නා ලදී. |
| | 01 / 15 | 6005 | ගිමිණී ගෙන් ලැබිය යුතු මුළු මුදල ලැබුණි. |
| | 01 / 18 | 2005 | රු. 150 000 ක් පිරිවැය වූ ලිපිද්‍රව්‍ය රු. 120 000 කට අතුපිට මුදලට විකුණන ලදී. |
| | 01 / 25 | <br>5002<br>5003 | වැටුප් ගෙවීම්<br>සමන් රු. 50 000<br>සහායක රු. 25 000 |
| | 01 / 26 | 5004 | මාසය සඳහා කාර්යාල වියදම් රු. 40 000 ක් දරන ලද අතර එයින් රු. 30 000 ක් ගෙවන ලදී . |
| | 01 / 29 | 3010 | රු. 10 000 ක වට්ටමක් ලබා දීමෙන් පසු නිමල් ගෙන් ලැබිය යුතු මුළු මුදල ලැබුණි. |
| | 01 / 30 | 5005 | සීමිත ජයමාල් පොදු සමාගමට ගෙවිය යුතු මුදල පියවන ලදී. |

2018 .02.03 දින ලද , ජනවාරි මාසය සඳහා ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශනය පහත පරිදි වේ.

සමන් වෙළෙන්දෝ

ගිණුම් අංකය : 5063 – 7000 - 8002

| දිනය | විස්තරය | හර ( රු . ) | බැර ( රු. ) | ශේෂය ( රු. ) |
|---|---|---|---|---|
| 01 / 01 | මුදල් තැන්පතු | | 600 000 | 600 000 |
| 01 / 03 | චෙක්පත් අංක 5001 | 300 0000 | | 300 000 |
| 01 / 07 | චෙක්පත් අංක 4450 | | 150 000 | 450 000 |
| 01 / 15 | චෙක්පත් අංක 6005 | | 200 000 | 650 000 |
| 01 / 18 | චෙක්පත් අංක 2005 | | 120 000 | 770 000 |

| | | | | |
|---|---|---|---|---|
| 01 / 25 | චෙක්පත් අංක 5002<br>චෙක්පත් අංක 5003 | 50 000<br>25 000 | | 695 000 |
| 01 / 26 | චෙක්පත් අංක 5004<br>බැංකු ගාස්තු | 30 000<br>5 000 | | 660 000 |
| 01 / 31 | ශේෂය | | | 660 000 |

අවශ්‍ය වන්නේ ,

( 1) අංක 1 සිට 12 දක්වා ගනුදෙනු වල බලපෑම ( අගයන් සහිතව ) ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කර එක් එක් අගය ඉදිරියන් එය වැඩිවේ නම් ( + ) ද , අඩුවේ නම් ( - ) ද , යන්න සඳහන් කරන්න. ( පිළිතුරු සැපයීමේ දී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිතා කරන්න. )

" 000 "

| ගනුදෙනු අංකය | වත්කම් | | | | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ පිරියත හා උපකරණ | තොග | වෙළඳ ලැබිය යුතු දෑ | මුදල් | වෙළඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපයුම් |
| | | | | | | | | |
| | | | | | | | | |

(2 ) 2018.01.31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් ලැබීම් ජර්නලය

( 3 ) 2018 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය ( බැංකු ප්‍රකාශනයෙහි ශේෂයෙන් ආරම්භ කරන්න. )

## 01.

- **මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

නුවන් විසින් 2020.01.01 දින ලිපිද්‍රව්‍ය අලෙවි සැලක් ආරම්භ කරන ලදි. ඔහුගේ සොහොයුරු සුජිත් මෙම ව්‍යාපාරයේ එකම සේවකයා විය. පහත ගනුදෙනු 2020 ජනවාරි මාසය තුල සිදු විය.

| අංකය | ගනුදෙනුව | වටිනාකම ( රු. 000 ) |
|---|---|---|
| 1 | ව්‍යාපාරය ආරම්භ කිරීමට නුවන් විසින් මුදල් යෙදවීම | 300 |
| 2 | ලිපිද්‍රව්‍ය අත්පිට මුදලට මිලදී ගැනීම | 200 |
| 3 | ලිපිද්‍රව්‍ය ණයටමිලදී ගැනීම | 550 |
| 4 | දෝෂ සහිත වූ බැවින් ණයට මිලදී ගත් ලිපිද්‍රව්‍ය වලින් කොටසක් ආපසු යැවීම | 50 |
| 5 | ලිපිද්‍රව්‍ය ණයට විකිණීම මෙය තුළ රු. 64 000 ක එකතු කළ අගය මත බදු ( VAT ) අඩංගුය. | 864 |
| 6 | සුජිත් ට වැටුප් ගෙවීම | 40 |

මාසය තුල විකුණු ලිපිද්‍රව්‍ය වල පිරිවැය රු. 500 000 ක් විය. 2020.01.31 දිනට ව්‍යාපාරය විසින් ගෙවිය යුතු විදුලි වියදම රු. 30 000 ක් විය. ගැනුම් සහ අනෙකුත් වියදම් මත **VAT** නොමැති බව උපකල්පනය කරන්න.

ගනුදෙනු අංක 1,2,3, සහ 4 හි ශුද්ධ බලපෑම් නිරූපනය කරනු ලබන ගිණුම්කරණ සමීකරණය කුමක් ද ?

| | වත්කම් ( රු. 000 ) | = | වගකීම් ( රු. 000 ) | + | හිමිකම් ( රු. 000 ) |
|---|---|---|---|---|---|
| 1) | + 800 | | + 550 | | + 250 |
| 2) | + 800 | | + 500 | | + 300 |
| 3) | + 850 | | + 550 | | + 300 |
| 4) | + 1 000 | | + 700 | | + 300 |
| 5) | + 1 000 | | + 750 | | + 250 |

## 02.

- **මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

පහත තොරතුරු සමන්ගේ ව්‍යාපාරයේ 2019 මාර්තු මාසයේ වැටුප් ලේඛනයෙන් උපුටා ගන්නා ලදී. මෙම ව්‍යාපාරය 2019.03.01 දින ආරම්භ කරන ලදී.

| විස්තරය | රු. 000 |
|---|---|
| දළ වැටුප | 500 |
| අඩුකළා : සේවක අර්ථ සාධක අරමුදලට ( EPF ) සේවක දායකය 10% | ( 50 ) |
| ශුද්ධ වැටුප | 450 |
| | |
| EPF සඳහා සේව්‍ය දායකය 15% | 75 |
| සේවක භාරකාර අරමුදලට ( ETF ) සේව්‍ය දායකය 3% | 15 |

කිසියම් මාසයක EPF හා ETF ඊළග මාසයේ 10 වන දින ප්‍රේෂණය කරනු ලබන අතර ශුද්ධ වැටුප එම මාසය තුලම ගෙවනු ලබයි.

**01.** සමන්ගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට ඉහත ගනුදෙනු වල බලපෑම පහත කුමන ගිණුම්කරණ සමීකරණයේ පෙන්වනු ලබයි ද ?

| | වත්කම් ( රු. 000 ) | = | වගකීම් ( රු. 000 ) | + | හිමිකම් ( රු. 000 ) |
|---|---|---|---|---|---|
| 1) | -450 | | + 50 | | -500 |
| 2) | -450 | | + 140 | | -590 |
| 3) | -500 | | - | | -500 |
| 4) | -500 | | + 90 | | -590 |
| 5) | -500 | | + 140 | | -640 |

**02.** පහත තොරතුරු තනි පුද්ගල ව්‍යාපාරයක් වන අමාලි ට්‍රේඩර්ස් සඳහා 2019.03.31 දිනට සපයා ඇත .

| | රු. |
|---|---|
| මුළු වත්කම් | 2 750 000 |
| මුළු වගකීම් | 1 650 000 |

JMC Learning "your virtual learning partner" suranga sampath

මෙම ව්‍යාපාරයේ 2018.03.31 දිනට හිමිකම රු. 800 000 ක් විය.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුලදී අයිතිකරු ව්‍යාපාරයෙන් රු. 250 000 ක් ගැනිලි ලෙස ලබාගත් අතර රු. 450 000 ක් අතිරේක ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරන ලදී.

පහත දෑ සඳහන් කරන්න.

අ) 2019.03.31 දිනට හිමිකම : රු. ..............................................

ආ ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය : රු. ....................................

**මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

නිහාල්ගේ ව්‍යාපාරයෙහි පහත ගනුදෙනු සිදු විය.

- 2018.03.01 - පිරිවැය රු. 150 000 ක් වූ භාණ්ඩ උපසේනගෙන් ණයට මිලදී ගැනීම
- 2018.03.05 - පිරිවැය රු. 30 000 ක් වූ භාණ්ඩ උපසේනට ආපසු යැවීම
- 2018.03.20 - පිරිවැය රු. 100 000 ක් වූ භාණ්ඩ රු. 160 000 කට ණයට විකිණීම
- 2018.03.20 - විකුණුම් කොමිස් රු. 10 000 ක් ආපසු ගෙවීම
- 2018.04.02 - උපසේනට ගෙවිය යුතු සම්පූර්ණ මුදල පියවීම

**01.** 2018.03.31 දිනට නිහාල් ගේ ව්‍යාපාරයේ ඉහත ගනුදෙනු වල ශුද්ධ බලපෑම නිරූපණය කරන ගිණුම්කරණ සමීකරණය වන්නේ ,

| | වත්කම් ( රු. 000 ) | = | වගකීම් ( රු. 000 ) | + | හිමිකම් ( රු. 000 ) |
|---|---|---|---|---|---|
| 1) | + 50 000 | | - | | + 50 000 |
| 2) | + 60 000 | | - | | + 60 000 |
| 3) | + 170 000 | | + 120 000 | | + 50 000 |
| 4) | + 170 000 | | + 150 000 | | + 20 000 |
| 5) | + 180 000 | | + 120 000 | | + 60 000 |

**02.** මූල්‍ය වර්ෂයක් තුල දී ව්‍යාපාරයක් විසින් උපයන ලද ලාභය නිරූපණය කරන සමීකරණය වනුයේ ,

1) වසර අග හිමිකම + ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වා දීම - වසර මුල හිමිකම
2) වසර අග හිමිකම + ගැනිලි - නව ප්‍රාග්ධනය හඳුන්වා දීම - වසර මුල හිමිකම
3) වසර අග හිමිකම - ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වා දීම - වසර මුල හිමිකම
4) වසර අග හිමිකම - ගැනිලි - නව ප්‍රාග්ධනය හඳුන්වා දීම - වසර මුල හිමිකම
5) වසර අග හිමිකම + ගැනිලි + නව ප්‍රාග්ධනය හඳුන්වා දීම + වසර මුල හිමිකම

## 04.

**01.** නුවන්ගේ ව්‍යාපාරය විසින් ලබාගත් ණය මුදලෙහි මාසාක වාරිකය වූ රු. 100 000 , නුවන් විසින් තම පෞද්ගලික මුදලින් ගෙවන ලදී. වාරිකය තුල අන්තර්ගත වූ පොලිය රු. 25 000 කි. පහත කුමන ගිණුම්කරණ සමීකරණය මෙම ගනුදෙනු වල ශුද්ධ බලපෑම දක්වනු ලබයි ද ? ( මූල්‍ය ප්‍රකාශන මාසිකව පිළියෙල කර ඇති බව උපකල්පනය කරන්න )

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | 0 | -75 000 | + 75 000 |
| 2) | 0 | -100 000 | + 100 000 |
| 3) | + 75 000 | 0 | + 75 000 |
| 4) | - 100 000 | -100 000 | 0 |

| 5) | - 100 000 | -75 000 | -25 000 |
|---|---|---|---|

**02.** ව්‍යාපාරය පහත ගනුදෙනු වල ශුද්ධ බලපෑම ( ( + ) හෝ ( - ) ලකුණ සහිතව අගයන් ) ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය කරන්නේ කෙසේ ද යන්න දක්වන්න.

| | ගනුදෙනුව | වත්කම්( රු. ) = | වගකීම් ( රු. ) | හිමිකම් ( රු.) |
|---|---|---|---|---|
| A | රු. 150 000 ක තොග ණයට මිළදී ගැනීම | ...................... | .................. | .................. |
| B | රු. 90 000 ක් පිරිවැය වූ තොග 140 000 කට අත්පිට මුදලට විකිණීම | ...................... | ................ | ................... |

## 05.

2016.04.01 දින සමන් රු. 100 000 කට භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී . එදිනට එම භාණ්ඩ රු. 120 000 කට අත්පිට මුදලට විකුණන ලද අතර ඒ සඳහා රු. 5 000 ක විකුණුම් වියදම් දරන ලදී. පහත ආකෘතිය භාවිතා කරමින් ගිණුම්කරණ සමීකරණය තුල මෙම ගනුදෙනු වල ශුද්ධ බලපෑම පෙන්වන්න.

වත්කම් ( රු. ) .....................= වගකීම් ( රු. ) .................... + හිමිකම ( + ) ...................

## 06.

ආයතනයක් විසින් ලකුණු කළ මිළ රු. 600 000 ක් වූ භාණ්ඩ 5% ක වෙළඳ වට්ටමකට යටත්ව ණයට මිලදී ගෙන පසුව රු. 650 000 ක අත්පිට මුදලට විකුණන ලදී. ණයහිමියන්ට ගෙවිය යුතු මුදල මේ දක්වා පියවා නොමැත. මෙම ගනුදෙනු වල ශුද්ධ බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය කරනුයේ ,

| | **වත්කම්** | **වගකීම්** | **හිමිකම්** |
|---|---|---|---|
| 1) | රු. 50 000 කින් වැඩිවේ | - | රු. 50 000 කින් වැඩිවේ |
| 2) | රු. 80 000 කින් වැඩිවේ | - | රු. 80 000 කින් වැඩිවේ |
| 3) | රු. 80 000 කින් වැඩිවේ | රු. 570 000 කින් අඩුවේ | රු. 650 000 කින් වැඩිවේ |
| 4) | රු. 650 000 කින් වැඩිවේ | රු. 570 000 කින් වැඩිවේ | රු. 80 000 කින් වැඩිවේ |
| 5) | රු. 650 000 කින් වැඩිවේ | රු. 600 000 කින් වැඩිවේ | රු. 50 000 කින් වැඩිවේ |

## 07.

ව්‍යාපාරය නයහිමියකුට ගෙවිය යුතු රු. 100 000 ක ශේෂයක් එහි අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් පියවන ලදී. පියවන අවස්ථාවේ දී , ණයහිමියා විසින් රු. 10 000 ක වට්ටමක ලබා දෙන ලදී. මෙම ගනුදෙනුව , වගකීම් සහ හිමිකමට කරන බලපෑම ගිණුම්කරණ සමීකරණයේ දක්වනුයේ ,

| | වගකීම් | හිමිකම් |
|---|---|---|
| 1) | රු. 90 000 කින් අඩුවේ | රු. 90 000 කින්අඩුවේ |
| 2) | රු. 90 000 කින් අඩුවේ | රු. 90 000 කින් වැඩිවේ |
| 3) | රු. 100 000 කින් අඩුවේ | රු. 100 000 කින් අඩුවේ |
| 4) | රු. 100 000 කින් අඩුවේ | රු. 100 000 කින් වැඩිවේ |
| 5) | රු. 110 000 කින් අඩුවේ | රු. 110 000 කින් වැඩිවේ |

## 08.

ව්‍යාපාර ආයතනයක් විසින් 10% ක වෙළඳ වට්ටමකට යටත්ව ලකුණු කළ මිල රු. 200 000 ක් වූ භාණ්ඩ ණය පදනම මත මිල දී ගන්නා ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය කරනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 180 000 කින් වැඩිවේ | රු. 180 000 කින් වැඩිවේ | - |
| 2) | රු.200 000 කින් වැඩිවේ | රු. 200 000 කින් වැඩිවේ | - |
| 3) | රු. 180 000 කින් වැඩිවේ | රු. 200 000 කින් වැඩිවේ | රු. 20 000 කින් අඩුවේ |
| 4) | රු. 200 000 කින් වැඩිවේ | රු. 180 000 කින් වැඩිවේ | රු. 20 000 කින් වැඩිවේ |
| 5) | රු. 200 000 කින් වැඩිවේ | රු. 220 000 කින් වැඩිවේ | රු. 20 000 කින් අඩුවේ |

## 09.

**01.** ආයතනයක් විසින් යන්ත්‍රයක් නඩත්තු කිරීම සඳහා රු. 8 000 ක් ගෙවන ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්නේ ,

01) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වගකීම් අඩුවීම් ලෙසය.
02) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වගකීම් වැඩිවීම ලෙසය
03) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් හිමිකම් අඩු වීම ලෙසය
04) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් හිමිකම් වැඩිවීම ලෙසය
05) රු. 8 000 කින් වත්කම් අඩුවීම සහ රු. 8 000 කින් වත්කම් වැඩිවීම ලෙසය.

**02.** වර්ෂය තුලදී තනි ව්‍යාපාරයක , වත්කම් රු. 400 000 කින් ද , වගකීම් රු. 50 000 කින් ද වැඩි විය. මෙම වර්ෂයේ දී ලාභය රු. 250 000 ක් නම් , අයිතිකරු විසින් හඳුන් වා දුන් අතිරේක ප්‍රාග්ධනය කොපමන ද ?

.............................................................................................................................

**01.** 2009.04.01 දින සමාගමක් රු. 800 000 කට උපකරණ ණයට අත්පත් කර ගන්නා ලදී. මෙම උපකරණ 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිරිවැය මත 10% ක් ක්ෂය කරන ලදී. මෙම ගනුදෙනු වල බලපෑම පහත සඳහන් කුමන සමීකරණය මඟින් පෙන්නුම් කරයි ද ?

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | + 800 000 | + 800 000 | - 80 000 |
| 2) | +800 000 | + 720 000 | + 80 000 |
| 3) | + 720 000 | + 800 000 | - 80 000 |
| 4) | +720 000 | + 720 000 | - |
| 5) | + 720 000 | - | + 720 000 |

**02.** පහත ගිණුම්කරණ සමීකරණ අතුරින් කුමන ගිණුම්කරණ සමීකරණය නිවරදි වන්නේ ද ?

A . ශුද්ධ වත් කම් = හිමිකම්

B . වත්කම් + ආදායම් = හිමිකම් + වගකීම් + වියදම්

C . වත්කම් + වියදම් = හිමිකම් + වගකීම් + ආදායම්

D . ශුද්ධ වත්කම් = මුළු වත්කම් - ජංගම නොවන වගකීම් - ජංගම වගකීම්

01 . B හා C පමණි. 02 . B , C හා D පමණි 03. A ,C හා D පමණි

04 . A , B හා C පමණි 05 . A , B , C හා D යන සියල්ලම

**03.** තනි ව්‍යාපාරයක පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉපයූ ලාභය කොපමණ ද ?

2009 . 04.01 දිනට හිමිකම රු. 500 000 කි.

2010.03.31 දිනට මුළු වත්කම සහ වගකීම පිළිවෙලින් රු. 800 000 ක් හා රු. 200 000 ක් විය.

වර්ෂය තුල ගැනිලි රු. 30 000 කි .

01) . රු. 100 000 02 ) . රු. 130 000 03 ). රු. 160 000

04 ) . රු. 500 000 05 ). රු. 600 000

- **පහත ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

2010.03.31 දිනට සමාගමක තෝරාගත් ශේෂපත්‍ර අයිතම සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය පහ දී ඇත.

| අයිතමය | රු. |
|---|---|
| මුළු වත්කම් | 8 200 |
| මුළු වගකීම් | 4 200 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 3 500 |



JMC Learning "your virtual learning partner" suranga sampath

| | |
|---|---|
| වර්ෂය සඳහා ලාභය | 1 000 |

**01.** 2010 මාර්තු 31 දිනට හිමිකම කොපමණ ද ?

1) රු. 1 000 2) රු. 4 000 3) රු. 4 200 4 ) රු. 4 500 5) රු. 8 200

**02.** 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් සඳහා ප්‍රතිලාභ කොපමන ද ?

1 ) රු. 1 000 2 ) රු. 4 000 3) රු. 4 200 4) රු. 4 500 5 ) රු. 8 000

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් VAT රහිත විකුණුම් මිල රු. 200 000 ක භාණ්ඩ 8% VAT වටිනාකමක් සමඟ ණයට විකුණන ලදී . ව්‍යාපාරය විකුණුම් පිරිවැය මත 25% ලාභාන්තිකයක් තබා ගනී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 208 000 කින් වැඩිවේ | වෙනස් නොවේ | රු.208 000 කින් වැඩිවේ |
| 2) | රු. 60 000 කින් වැඩිවේ | රු. 16 000 කින් අඩුවේ | රු. 40 000 කින් වැඩිවේ |
| 3) | රු. 56 000 කින් වැඩිවේ | රු. 16 000 කින් වැඩිවේ | රු. 208 000 කින් වැඩිවේ |
| 4) | රු. 56 000 කින් වැඩිවේ | රු. 16 000 කින් වැඩිවේ | රු. 40 0000 කින් වැඩිවේ |
| 5) | රු. 56 000 කින්අඩුවේ | රු. 16 000 කින් වැඩිවේ | රු. 40 0000 කින් අඩුවේ |

01.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් VAT සහිත විකුණුම් මිල රු. 432 000 ක භාණ්ඩ 8% VAT වටිනාකමක් සමඟ ණයට විකුණන ලදී . ව්‍යාපාරය විකුණුම් පිරිවැය මත 25% ලාභාන්තිකයක් තබා ගනී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 432 000 කින් වැඩිවේ | රු. 16 000 කින් වැඩිවේ | රු.416 000 කින් වැඩිවේ |
| 2) | රු. 112 කින් වැඩිවේ | රු. 32 000 කින් අඩුවේ | රු. 80 000 කින් වැඩිවේ |
| 3) | රු. 112 000 කින් වැඩිවේ | රු. 16 000 කින් වැඩිවේ | රු. 320 000 කින් වැඩිවේ |
| 4) | රු. 432 000 කින් වැඩිවේ | රු. 32 000 කින් වැඩිවේ | රු. 400 0000 කින් වැඩිවේ |
| 5) | රු. 112 000 කින් වැඩිවේ | රු. 32 000 කින් වැඩිවේ | රු. 80 000 කින් වැඩිවේ |

02.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් VAT රහිත විකුණුම් මිල රු. 800 000 ක භාණ්ඩ 8% VAT වටිනාකමක් සමඟ ණයට විකුණන ලදී . ව්‍යාපාරය විකුණුම් පිරිවැය මත 25% ලාභාන්තිකයක් තබා ගනී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 864 000 කින් වැඩිවේ | රු. 64 000 කින් වැඩිවේ | රු.800 000 කින් වැඩිවේ |
| 2) | රු.8 64 000 කින් වැඩිවේ | රු. 64 000 කින් අඩුවේ | රු. 864 000 කින් වැඩිවේ |
| 3) | රු. 224 000 කින් වැඩිවේ | රු. 64 000 කින් වැඩිවේ | රු. 160 000 කින් වැඩිවේ |
| 4) | රු. 224 000 කින් වැඩිවේ | රු. 64 000 කින් වැඩිවේ | රු. 640 0000 කින් අඩුවේ |
| 5) | රු. 864 000 කින් අඩුවේ | රු. 64 000 කින් වැඩිවේ | රු. 800 0000 කින් අඩුවේ |

## 03.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් VAT සහිත විකුණුම් මිල රු. 86 400 ක භාණ්ඩ 8% VAT වටිනාකමක් සමඟ ණයට විකුණන ලදී . ව්‍යාපාරය විකුණුම් පිරිවැය මත 25% ලාභාන්තිකයක් තබා ගනී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 64 000 කින් වැඩිවේ | රු. 16 000 කින් වැඩිවේ | රු.86 400 කින් වැඩිවේ |
| 2) | රු. 86 400 කින් වැඩිවේ | රු 6 400 කින් වැඩිවේ | රු. 80 000 කින් වැඩිවේ |
| 3) | රු. 22 400 කින් වැඩිවේ | රු. 6 400 කින් වැඩිවේ | රු. 16 000 කින් වැඩිවේ |
| 4) | රු. 64 000 කින් වැඩිවේ | රු. 6 4 000 කින් වැඩිවේ | රු. 16 0000 කින් වැඩිවේ |
| 5) | රු. 86 400 කින් වැඩිවේ | රු. 6 400 කින් වැඩිවේ | රු. 80 000 කින් වැඩිවේ |

## 04.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් VAT රහිත විකුණුම් මිල රු150 000 ක භාණ්ඩ 8% VAT වටිනාකමක් සමඟ ණයට විකුණන ලදී . ව්‍යාපාරය විකුණුම් පිරිවැය මත 20 % ලාභාන්තිකයක් තබා ගනී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 162 000 කින් වැඩිවේ | රු. 12 000 කින් වැඩිවේ | රු.150 000 කින් වැඩිවේ |
| 2) | රු. 37 000 කින් වැඩිවේ | රු12 000 කින් වැඩිවේ | රු. 80 000 කින් වැඩිවේ |
| 3) | රු. 125 000 කින් අඩුවේ | රු. 37 000 කින් අඩුවේ | රු. 162 000 කින් වැඩිවේ |
| 4) | රු. 125 000 කින් වැඩිවේ | රු. 37 000 කින් වැඩිවේ | රු. 162 0000 කින් වැඩිවේ |
| 5) | රු. 150 000 කින් වැඩිවේ | රු. 12 000 කින් වැඩිවේ | රු. 150 000 කින් වැඩිවේ |

## 05.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් රු. 120 000 පිරිවැය වූ භාණ්ඩ 8% VAT වටිනාකමක් සමඟ ණයට විකුණන ලදී . ව්‍යාපාරය විකුණුම් පිරිවැය මත 20 % ලාභාන්තිකයක් තබා ගනී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 35 520 කින් වැඩිවේ | රු. 11 520 කින් වැඩිවේ | රු.24 000 කින් වැඩිවේ |
| 2) | රු. 144 000 කින් වැඩිවේ | රු 9 600 කින් වැඩිවේ | රු. 134 400 කින් වැඩිවේ |
| 3) | රු. 120 000 කින් අඩුවේ | රු. 9 600 කින් අඩුවේ | රු. 134 400 කින් අඩුවේ |
| 4) | රු. 120 000 කින් වැඩිවේ | රු. 9 600 කින් වැඩිවේ | රු. 144 000 කින් වැඩිවේ |
| 5) | රු. 144 000 කින් වැඩිවේ | රු. 9 600 කින් වැඩිවේ | රු. 134 400 කින් වැඩිවේ |

## 06.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් 8% VAT වටිනාකමක් සමඟ රු. 540 000 ක භාණ්ඩ ණයට විකුණන ලදී . ව්‍යාපාරය විකුණුම් මිල මත 20 % ලාභාන්තිකයක් තබා ගනී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 540 000 කින් වැඩිවේ | රු. 43 200 කින් වැඩිවේ | රු.496 800 කින් වැඩිවේ |
| 2) | රු. 144 000 කින් වැඩිවේ | රු 9 600 කින් වැඩිවේ | රු. 134 400 කින් වැඩිවේ |
| 3) | රු. 540 000 කින් අඩුවේ | රු. 140 000 කින් අඩුවේ | රු. 400 000 කින් අඩුවේ |
| 4) | රු. 140 000 කින් වැඩිවේ | රු. 40 000 කින් වැඩිවේ | රු. 100 000 කින් වැඩිවේ |
| 5) | රු. 496 800 කින් අඩුවේ | රු. 43 200 කින් අඩුවේ | රු. 540 000කින් වැඩිවේ |

## 07.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක පහත ගනුදෙනු සිදු විය. භාණ්ඩ වල පිරිවැය රු. 240 000 කි. VAT අනුපාතය 8% කි. . ව්‍යාපාරය විකුණුම් මිල මත 20 % ලාභාන්තිකයක් තබා ගනී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 240 000 කින් අඩුවේ | රු. 19 200 කින් වැඩිවේ | රු.220 800 කින් අඩුවේ |
| 2) | රු. 84 000 කින් වැඩිවේ | රු 24 000 කින් වැඩිවේ | රු. 60 000 කින් වැඩිවේ |
| 3) | රු. 300 000 කින් වැඩිවේ | රු. 84 000 කින් අඩුවේ | රු. 240 000 කින් අඩුවේ |
| 4) | රු. 324 000 කින් වැඩිවේ | රු. 24 000 කින් වැඩිවේ | රු. 300 000 කින් වැඩිවේ |
| 5) | රු. 240 000 කින් අඩුවේ | රු. 19 200 කින් අඩුවේ | රු. 240 000කින් වැඩිවේ |

## 08.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් වන සී/ස මානෙල් ව්‍යාපාරය පිරිවැය රු. 160 000 භාණ්ඩ තොගයක් 8% VAT සහිතව ණයට විකුණා තිබුණි. අදාල ණයගැතියා විසින් භාණ්ඩ වලින් හරි අඩක් ආපසු එවා තිබුණි. මානෙල් ව්‍යාපාරය විකුණුම් මත 20 % ලාභාන්තිකයක් තබා ගනී. භාණ්ඩ ආපසු එවීමට අදාල බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම |
|---|---|---|---|
| 1) | රු. 216 000 කින් අඩුවේ | රු. 16 000 කින් අඩුවේ | රු.200 000 කින් අඩුවේ |
| 2) | රු. 84 000 කින් අඩුවේ | රු 16 000 කින් අඩුවේ | රු. 100 000 කින් වැඩිවේ |
| 3) | රු. 28 000 කින් අඩුවේ | රු. 8 000 කින් අඩුවේ | රු. 20 000 කින් අඩුවේ |
| 4) | රු. 108 000 කින් අඩුවේ | රු. 8 000 කින් අඩුවේ | රු.100 000 කින් අඩුවේ |
| 5) | රු. 20 000 කින් අඩුවේ | රු. 8 000 කින් අඩුවේ | රු. 28 000 කින්අඩුවේ |

## 09.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් වන සී/ස සපුමල් ව්‍යාපාරය විකුණුම් මිල ( VAT රහිත ) රු. 720 000 භාණ්ඩ තොගයක් 8% VAT සහිතව ණයට විකුණා තිබුණි. අදාල ණයගැතියා විසින් භාණ්ඩ වලින් පිරිවැය රු. 150 000 ක් වූ භාණ්ඩ තොගයක් ආපසු එවා තිබුණි. සපුමල් ව්‍යාපාරය විකුණුම් මත 20 % ලාභාන්තිකයක් තබා ගනී. භාණ්ඩ ආපසු එවීමට අදාල බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම |
|---|---|---|---|
| 1) | රු. 150 000 කින් අඩුවේ | රු. 12 000 කින් අඩුවේ | රු.138 000 කින් අඩුවේ |
| 2) | රු. 44 400 කින් අඩුවේ | රු 14 400 කින් අඩුවේ | රු. 30 000 කින් අඩුවේ |
| 3) | රු. 187 500 කින් අඩුවේ | රු. 15 000 කින් අඩුවේ | රු. 172 500කින් අඩුවේ |
| 4) | රු.52 500 කින් අඩුවේ | රු. 15 000 කින් අඩුවේ | රු.37 500 කින් අඩුවේ |
| 5) | රු. 37 500 කින් අඩුවේ | රු. 14 400 කින් අඩුවේ | රු. 23 100 කින්අඩුවේ |

## 10.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් වන සී/ස කල්‍යාණි ව්‍යාපාරය ණයට විකුණන ලද භාණ්ඩ වලින් රු ; 40 000ක විකුණුම් මිලක් සහිත ( VAT රහිත ) භාණ්ඩ තොගයක් අදාල ණයගැතියකු විසින් අපසු එවා තිබුණි. 8% VAT සහිතව ණයට විකුණා තිබුණි.. කල්‍යාණි ව්‍යාපාරය පිරිවැය මත 20 % ලාභාන්තිකයක් තබා ගනී. භාණ්ඩ ආපසු එවීමට අදාල බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම |
|---|---|---|---|
| 1) | රු. 11 200 කින් අඩුවේ | රු. 3 200 කින් අඩුවේ | රු.8 000 කින් අඩුවේ |
| 2) | රු. 43 200 කින් අඩුවේ | රු 3 200 කින් අඩුවේ | රු. 40 000 කින් අඩුවේ |
| 3) | රු. 40 000 කින් අඩුවේ | රු. 3 200 කින් අඩුවේ | රු. 36 800කින් අඩුවේ |
| 4) | රු.32 000 කින් අඩුවේ | රු. 8 000 කින් අඩුවේ | රු.24 000 කින් අඩුවේ |
| 5) | රු. 32 000 කින් අඩුවේ | රු. 3 200 කින් වැඩිවේ | රු. 40 000 කින්අඩුවේ |

## 11.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් වන සී/ස නුවන් ව්‍යාපාරය රු. 64 800 භාණ්ඩ තොගයක් ( VAT සහිත ) ණයට ගන්නා ලදී. VAT අනුපාතය 8% කි. මෙම ගනුදෙනුවට අදාල බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 64 800 කින් වැඩිවේ | රු. 4 800 කින් වැඩිවේ | රු.60 000 කින් වැඩිවේ. |
| 2) | රු. 64 800 කින් වැඩිවේ | රු 64 800 කින් වැඩිවේ | වෙනසක් නොවේ |
| 3) | රු. 60 000 කින් වැඩිවේ | රු. 4 800 කින් වැඩිවේ | රු. 55 200 කින් වැඩිවේ |
| 4) | රු. 64 800 කින් වැඩිවේ | රු.64 800 කින් වැඩිවේ | රු.4 800කින් අඩුවේ |
| 5) | රු. 64 800 කින් අඩුවේ | රු. 4 800 කින් වැඩිවේ | වෙනසක් නොවේ |

## 12.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් වන සී/ස නුවන් ව්‍යාපාරය රු. 120 000 භාණ්ඩ තොගයක් ( VAT රහිත ) ණයට ගන්නා ලදී. VAT අනුපාතය 8% කි.මෙම ගනුදෙනුවට අදාල බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 129 600 කින් වැඩිවේ | රු. 9 600 කින් වැඩිවේ | රු.120 000 කින් වැඩිවේ. |
| 2) | රු. 120 000 කින් වැඩිවේ | රු 9 600 කින් වැඩිවේ | වෙනසක් නොවේ |
| 3) | රු. 129 600 කින් වැඩිවේ | රු. 129 600 කින් වැඩිවේ | වෙනසක් නොවේ |
| 4) | රු. 9 600 කින් වැඩිවේ | රු.9 600 කින් වැඩිවේ | රු.120 000 කින් අඩුවේ |
| 5) | රු. 9 600 කින් අඩුවේ | රු. 9 600 කින් වැඩිවේ | වෙනසක් නොවේ |

## 13.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් වන සී/ස අප්සරා ව්‍යාපාරය රු. 86 400 භාණ්ඩ තොගයක් ( VAT සහිතව ) නාමල් ව්‍යාපාරයෙන් ණයට ගන්නා ලදී. VAT අනුපාතය 8% කි. නාමල් ව්‍යාපාරය විකුණුම් මිලට 20% ලාභාන්තිකයන් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. අප්සරාගේ ව්‍යාපාරයේ මෙම ගනුදෙනුවට අදාල බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය වනුයේ ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| 1) | රු. 80 000 කින් වැඩිවේ | රු. 6 400 කින් වැඩිවේ | රු.73 600 කින් වැඩිවේ. |
| 2) | රු. 86 400 කින් වැඩිවේ | රු 86 400 කින් වැඩිවේ | වෙනසක් නොවේ |
| 3) | රු. 80 000 කින් වැඩිවේ | රු. 6 400 කින් වැඩිවේ | වෙනසක් නොවේ |
| 4) | රු. 86 400 කින් වැඩිවේ | රු.6 400කින් වැඩිවේ | රු.80 000 කින් අඩුවේ |
| 5) | රු. 6 400 කින් අඩුවේ | රු. 86 400 කින් වැඩිවේ | වෙනසක් නොවේ |

## 14.

VAT සඳහා ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් වන සී/ස සුසිලා ව්‍යාපාරය රු. 168 480 භාණ්ඩ තොගයක් ( VAT සහිතව ) කමල් ව්‍යාපාරයෙන් ණයට ගන්නා ලදී. VAT අනුපාතය 8% කි. කමල් ව්‍යාපාරය පිරිවැයට 20% ලාභාන්තිකයන් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. කමල් ව්‍යාපාරයේ මෙම ගනුදෙනුවට අදාල බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපනය වනුයේ ,

වත්කම් | වගකීම් | හිමිකම්

| | | | |
|---|---|---|---|
| 1) | රු. 168 480 කින් වැඩිවේ | රු. 168 480 කින් වැඩිවේ | වෙනස් නොවේ. |
| 2) | රු. 156 000 කින් වැඩිවේ | රු 12 480 කින් වැඩිවේ | රු. 168 480 කින් අඩුවේ |
| 3) | රු. 38 480 කින් වැඩිවේ | රු. 12 480 කින් වැඩිවේ | රු.26 000 කින් වැඩිවේ |
| 4) | රු. 168 480 කින් වැඩිවේ | රු. 12 480 කින් වැඩිවේ | රු. 156 000 කින් වැඩිවේ |
| 5) | රු. 38 480 කින් වැඩිවේ | රු. 38 480 කින් වැඩිවේ | වෙනසක් නොවේ |

JMC Learning "your virtual learning partner" suranga sampath